

පූජ්‍ය කොටහේනේ ප්‍රඥාකීර්ති හිමි

# පීඨාධිපතිවරු

## පූජ්‍ය කොටහේනේ පඤ්ඤාකිත්ති නා හිමි

මහාචාර්ය කුලතිලක කුමාරසිංහ

1959 ජනවාරි මස 1 දින නිල වශයෙන් ආරම්භ කරන ලද්දා වූ ද එම වසරේ ජූනි මස 17 වන දින සිට ක්‍රියාත්මක වන්නට වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, සමාරම්භයේ දී පීඨ පහකින් යුක්ත වූයේ ය. එනම් භාෂා පීඨය, බෞද්ධ පීඨය, කලා පීඨය, විද්‍යා පීඨය හා දර්ශන හා පර්යේෂණ පීඨය යනුවෙනි. භාෂා පීඨාධිපති වූයේ ත්‍රිපිටකාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති ස්වාමීන්වහන්සේ ය. සිංහල අංශ ප්‍රධාන මෙන් ම සිංහල අංශයේ මහාචාර්යවරයා වූයේ ද එහිමියෝ ය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ප්‍රාඥයකු වූ පඤ්ඤාකිත්ති නාහිමි කොටහේනේ ලෝරන්ස් පෙරේරා නම් කවියාගේ හා එම් පෙරේරා මහත්මියගේ බාල ම පුත්‍ර රත්නය විය. ඒ 1907 ජූනි මස 09 දා මෙලොව එළිය දුටු ලියෝ ෆ්‍රැන්සිස් ආල දරුවා ය.

සිය පියා විසින් ලියන ලද ලිපි ලේඛන වලින් නිවැරදි කර ගැනීම සඳහා පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනට යාමට පෙළඹුණු ඔහු පාසැලෙන් ඉංග්‍රීසි අධ්‍යාපනයත්, පිරිවෙනෙන් පෙරදිග භාෂා හා ආගමික අධ්‍යාපනයත් ලැබුවේය. බුදු දහම විෂයෙහි ඉමහත් අවධානයක් යොමු කළ කුඩා ෆ්‍රැන්සිස් 1924 නොවැම්බර් 31 වන දා පැවිදි ජීවිතයට ප්‍රවිෂ්ට වූයේ ය. ඒ විද්‍යාලංකාර පිරිවෙනේ නිවුනු පරිවෙණාධිපතිවරයකු වූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය පණ්ඩිත ලුණුපොකුණේ ධර්ම කීර්ති ශ්‍රී ධර්මානන්දාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා පණ්ඩිත භාද්දේගම ඥානානන්ද ස්ථවිරයන් වහන්සේගේ කර්මාචාර්යත්වයෙනි. මුලින් සද්ධාතිස්ස යැයි නම් තෙරුණ ද පසුව ප්‍රඥාවෙන් කීර්තියට පත්වන බැව් හොඳින් පසක් කර ගෙන පඤ්ඤාකිත්ති යන නම තබනු ලැබිය.

වැලම්විටියාවේ ධම්මරක්ඛිත ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ සුපිරිසිදු සිල්වත් ජීවිතය අරබයා මෙසේ පවසයි.